සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA3 විභාගය - 2020 ජනවාරි

## (AA35) සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය

(Corporate and Personal Taxation)

2020-01-19
පස්වරු
[1.45 – 5.00]

පිටු ගණන : 08
ප්‍රශ්න ගණන: 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය)**:**
  (1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
  *උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*
  (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
  (3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*
  (4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  (5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*
  (6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  (7) *ලකුණු 100 යි.*

---

## A කොටස

අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ 2 වන වගන්තිය අනුව:

- යම් තක්සේරු වර්ෂයක් සඳහා බදු අයකළ හැකි ආදායමක් ලබන තැනැත්තෙකු විසින්, හෝ,
- එම වර්ෂය තුළදී අවසාන රඳවාගැනීමේ ගෙවීමක් ලබන තැනෙත්තෙකු විසින්,

එක් එක් තක්සේරු වර්ෂය සඳහා, ආදායම් බද්ද ගෙවිය යුතුය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) අවසාන රඳවා ගැනීමේ ගෙවීම් (Final Withholding Payments) යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(b) 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත යටතේ දක්වා ඇති අවසාන රඳවා ගැනීමේ ගෙවීම් දෙකක්(02) **හඳුනා දක්වන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

මහා පරිමාණ ඇඟළුම් නිෂ්පාදන සමාගමක් වන **සීමාසහිත AG ගාමන්ට්ස් (පෞද්ගලික) සමාගමේ** අලුතෙන් පත්කරන ලද වැටුප් ගණකාධිකාරිවරයා ඔබ වේ. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් මෑතකදී සමාගමේ ලියවිලි පරීක්ෂා කළ බවත් උපයනවිට ගෙවීමේ බදු ක්‍රමය (PAYE) යටතේ වන රෙගුලාසි අනුගමනය කළ යුතු බවට උපදෙස් දුන් බව කළමනාකරණය විසින් ඔබට දැනුම් දුනි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

උපයනවිට ගෙවීමේ බදු ක්‍රමය යටතේ සේවායෝජකයෙකුගේ වගකීම් පහක්(05) **සඳහන් කරන්න.** (ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

**සමරසිංහ** අවුරුදු 20 ක කාලයක සිට **සීමාසහිත XYZ පොදු සමාගමේ** කළමනාකරුවෙක් වශයෙන් සේවය කරයි. 2018/19 තක්සේරු වර්ෂය තුළදී ඔහුට සැත්කමක් සිදුකරන ලද අතර, ඔහුගේ දිගුකාලීන සේවයට පිළිගැනීමක් ලෙස සමාගම රු. මිලියන 1 ක විශේෂ ගෙවීමක් ඔහුට කරන ලදි.

එම ගෙවීම සේවායෝජකයාගෙන් ලැබුණු ත්‍යාගයක් නිසා එය බදු අය කළහැකි ආදායමේ කොටසක් නොවන බව **සමරසිංහ** සිතයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

සමාගමෙන් ලැබුනු විශේෂ ගෙවීම, **සමරසිංහගේ** බදු අය කළහැකි ආදායමක්දැයි **පැහැදිලි කරන්න**.
*(ඔබේ තීරණය නිශ්චිත නඩු තීන්දු ඇසුරෙන් තහවුරු කරන්න.)* (ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

**හීරෝ කෝපරේෂන් ඉන්ඩියා,** ශ්‍රී ලංකාවේ පිහිටි එහි ව්‍යාපෘති කාර්යාලය හරහා ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් ව්‍යාපෘතියක් බාරගෙන තිබේ. තාක්ෂණික ඉංජිනේරුවරයෙක් වූ **රොබින්,** ඉංජිනේරුවරයෙකු වශයෙන් අවුරුදු දෙකක සේවා නියුක්ත ගිවිසුමක් යටතේ ඔහුගේ රාජකාරී බාර ගැනීමට 2018 ජූලි 15 වන දින ශ්‍රී ලංකාවට පැමිණි අතර, ඔහු 2019 මාර්තු 02 දින දක්වා ශ්‍රී ලංකාවේ රැඳී සිටියේය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2018/19 තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ බදු අරමුණු සඳහා රොබින්ගේ වාසිකභාවය **පැහැදිලි කරන්න**.

(ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

## <u>B කොටස</u>

අනිවාර්ය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

## 05 වන ප්‍රශ්නය

**දයාරත්න** සහ ඔහුගේ වැඩිමල් පුත් **දිලුම්** විසින් 2017 දී බේකරි නිෂ්පාදිත නිෂ්පාදකයෙකු වශයෙන් කටයුතු කිරීම සඳහා **ඩී සහ පුත්‍රයෝ** නමින් හවුල් ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි. හවුල් ව්‍යාපාරයේ ගිවිසුම අනුව ලාභා'ලාභ පිළිවෙලින් 2:1 අනුපාතයට **දයාරත්න** සහ **දිලුම්** අතර බෙදාගැනීමට එකඟ විය.

2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන අනුව හවුල් ව්‍යාපාරයේ පිරිවැටුම සහ ශුද්ධ ලාභය පිළිවෙලින් රු.46,550,000/- ක් සහ රු.9,638,000/- ක් විය.

(1) ශුද්ධ ලාභය ගණනය කිරීමේදී පහත සඳහන් වියදම් අඩුකර තිබේ:

| | රු. |
|---|---|
| හවුල්කරුවන්ට ගෙවූ වැටුප් | 2,880,000 |
| කුලිය | 960,000 |
| ක්ෂය | 80,000 |

(2) ව්‍යාපාරයේ කටයුතුවලට සම්බන්ධවීම වෙනුවෙන් **දයාරත්න** සහ **දිලුම්** පිළිවෙලින් මසකට රු.110,000/- ක් සහ රු.130,000/- ක් බැගින් වැටුප් ලබා ගනියි.

(3) **දයාරත්නගේ** නිවසේ පළමු මහළ හවුල් ව්‍යාපාරයේ කාර්යාලය වශයෙන් භාවිත කිරීම වෙනුවෙන් ඔහුට කුලිය ගෙවා තිබේ.

(4) 2018/19 තක්සේරු වර්ෂය සඳහා බදු අරමුණු සඳහා වත්කම් මත ප්‍රාග්ධන දීමනාව රු.90,000/- කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2018/19 තක්සේරු වර්ෂය සඳහා පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(a) බදු අරමුණු සඳහා හවුල් ව්‍යාපාරයේ ආදායම. (ලකුණු 03)

(b) හවුල් ව්‍යාපාරයේ ආදායම මත හවුල් ව්‍යාපාරය විසින් ගෙවිය යුතු රඳවාගැනීමේ බද්ද. (ලකුණු 02)

(c) එක් එක් හවුල්කරුවාගේ හවුල් ව්‍යාපාරයේ ආදායම් කොටස. (ලකුණු 03)

(d) එක් එක් හවුල්කරුවාට තිබෙන රඳවාගැනීමේ බදු බැර. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

**සීමාසහිත BA කන්සල්ටන්ස් (පෞද්ගලික) සමාගම,** එකතු කළ අගය මත බද්ද (VAT) සඳහා ලියාපදිංචි සමාගමකි. එහි ප්‍රධානතම කාර්යය වන්නේ ශ්‍රී ලංකාවේ සේවාදායකයන්ට කළමනාකරණ උපදේශන සේවා සැපයීමයි. එයට අමතරව සමාගම වෘත්තීය විභාග සඳහා පන්ති පැවැත්වීම ද සිදුකරනු ලබයි.

2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා සමාගමේ පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටා ගන්නා ලදි:

(1) පිරිවැටුම පිළිබඳ විස්තර (එකතු කළ අගය මත බදු රහිතව):

| | රු. |
|---|---|
| උපදේශන සේවාවලින් | 7,425,000 |
| අධ්‍යාපන සේවාවලින් - පන්ති පැවැත්වීම | 1,856,250 |
| **එකතුව** | **9,281,250** |

(2) කාර්තුව තුළදී සමාගම පහත සඳහන් යෙදවුම් බදු (input tax) ගෙවා තිබේ.

| | රු. |
|---|---|
| පන්ති සඳහා නිබන්ධන මුද්‍රණය කිරීම මත | 143,000 |
| කාර්යාල වියදම් මත (කාර්යයන් දෙකම සඳහා කාර්යාලය පාවිච්චි කරනු ලබයි) | 264,000 |
| ගමන් බිමන් සඳහා පාවිච්චි කරන මෝටර් රථය සඳහා ගෙවූ රක්ෂණ වාරිකය මත | 9,000 |
| | **416,000** |

(3) පසුගිය කාර්තුවෙන් ඉදිරියට ගෙන එන ලද වැඩිපුර ගෙවූ යෙදවුම් බද්ද රු.57,600/- කි.

(4) 2019 මාර්තු 31 දිනෙන් අවසන් කාර්තුව සඳහා සමාගම එකතු කළ අගය මත බදු වාරික වශයෙන් රු.400,000/- ක් ගෙවා තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ඉතිරි ගෙවිය යුතු / (වැඩිපුර ගෙවූ) එකතුකළ අගය මත බද්ද (VAT) **තක්සේරු කරන්න.** (ලකුණු 08)

(b) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා එකතු කළ අගය මත බදු වාර්තාව ඉදිරිපත් කිරීමට නියමිත දිනය **සඳහන් කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 10)

## **07** වන ප්‍රශ්නය

**සීමාසහිත ABC (පෞද්ගලික) සමාගම,** ශ්‍රී ලංකාවේ සංස්ථාපනය කරන ලද වාසික සමාගමකි. සමාගම 2018/19 තක්සේරු වර්ෂය සඳහා තවමත් ආදායම් වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. **සීමාසහිත ABC (පෞද්ගලික) සමාගමේ** බදු උපදේශකවරයා ඔබ වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2018/19 තක්සේරු වර්ෂය සඳහා ආදායම් වාර්තාව ඉදිරිපත් කළ යුතු නියමිත දිනය **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) ආදායම් වාර්තාව ඉදිරිපත් කිරීමට අපොහොසත්වීම මත පැනවිය හැකි දණ්ඩන (penalties) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(c) 2018/19 තක්සේරු වර්ෂය සඳහා ආදායම් වාර්තාව නියමිත දින හෝ ඊට පෙර ඉදිරිපත් කලේ නම්, සහකාර කොමසාරිස්ට තක්සේරුවක් නිකුත් කිරීම සඳහා ඇති ව්‍යවස්ථාපිත කාල අවකාශය (statutory time bar) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(d) පැහැර හරිනලද තක්සේරුව (default assessment) යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

# <u>C කොටස</u>

අනිවාර්ය ප්‍රශ්න දෙක (02) කි.

(මුළු ලකුණු 50)

## **08** වන ප්‍රශ්නය

**සීමාසහිත ෆැෂන් ඩිසයිනර්ස් හෝල්ඩිං (පෞද්ගලික) සමාගමේ (FDH)** සම්පූර්ණ අයිතිය තිබෙන පරිපාලිත සමාගමක් වන **සීමාසහිත ස්මාට් ලුක් (පෞද්ගලික) සමාගම (SLP)** 2014 දී ආරම්භ කරන ලදී. **සීමාසහිත ස්මාට් ලුක් (පෞද්ගලික) සමාගම,** ළමා ඇඳුම් නිෂ්පාදනය කර, දේශීය වෙළෙඳපොළට විකිණීමේ නිරතව සිටියි.

පහත සඳහන් තොරතුරු SLP හි මූල්‍ය ප්‍රකාශනවලින් උපුටාගන්නා ලදී:

(1) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනයේ සාරංශය පහත දැක්වේ:

| | රු. |
|---|---:|
| පිරිවැටුම | 368,150,000 |
| විකුණුම් පිරිවැය | (254,250,000) |
| **දළ ලාභය** | **113,900,000** |
| වෙනත් ආදායම් | |
| FDH සමාගමට දුන් ණය මුදල මත පොලී ආදායම | 200,000 |
| ස්ථාවර තැන්පතුව මත පොලී ආදායම (දළ) | 800,000 |
| ලාභාංශ ආදායම (ශුද්ධ) | 500,000 |
| යන්ත්‍රය විකිණීමෙන් ලාභය | 600,000 |
| | **116,000,000** |
| බෙදාහැරීමේ වියදම් | (27,300,000) |
| පරිපාලන වියදම් | (51,780,000) |
| මූල්‍ය වියදම් | (2,400,000) |
| **ආදායම් බදුවලට පෙර ලාභය** | **34,520,000** |

(2) පරිපාලන වියදම් තුළ පහත සඳහන් ඒවා ඇතුලත් වේ:

- වර්ෂය සඳහා පාරිතෝෂික වෙන්කිරීම රු.2,900,000/- ක් වන අතර, වර්ෂය තුලදී රු.1,000,000/- ක මුදලක් විශ්‍රාම ගත් සේවකයන් සඳහා ගෙවා තිබේ.
- වර්ෂය සඳහා ක්ෂය අයකිරීම රු.3,500,000/- ක් විය.
- සහකාර කොමසාරිස් සමඟ එළැඹුණ එකඟතාවය අනුව, 2017/18 තක්සේරු වර්ෂය සඳහා අතිරේක බදු වශයෙන් රු.340,000/- ක මුදලක් දෙපාර්තමේන්තුවට ගෙවා තිබේ.
- සමාගම අනුමත පුණ්‍යායතනයක් වූ වැඩිහිටි නිවාසයකට රු.850,000/- ක් වටිනා භාණ්ඩ පරිත්‍යාග කර ඇත.

(3) බෙදාහැරීමේ වියදම් තුළ පහත සඳහන් ඒවා ඇතුලත් වේ:

- විදේශීය අමුද්‍රව්‍ය සැපයුම්කරුවන් හමුවීම වෙනුවෙන් අධ්‍යක්ෂකවරුන්ගේ විදේශ ගමන් වියදම් වෙනුවෙන් රු.1,100,000/- ක මුදලක් දරා තිබේ.
- ඉඩමක් මිලදී ගැනීම සඳහා පළකල පුවත්පත් දැන්වීමක් සඳහා රු.90,000/- ක් සහ රෙදි සැපයුම්කරුවන් සොයා ගැනීම සඳහා ටෙන්ඩර් ලංසු කැඳවීම වෙනුවෙන් පුවත්පත් දැන්වීමක් සඳහා රු.110,000/- ක් දරා තිබේ.
- සේවක මණ්ඩලය වෙනුවෙන් සංවිධානය කළ වාර්ෂික සුහද හමුව සඳහා රු.350,000/- ක පිරිවැයක් දරා තිබේ.

(4) දේපළ, පිරියත සහ උපකරණ පිළිබඳ විස්තර පහත දැක්වේ:

**පිරිවැය**

| වත්කම් | 2018 අප්‍රේල් 01 දිනට ශේෂය (රු.) | එකතු කිරීම් (රු.) | ඉවත්කිරීම් (රු.) | 2019 මාර්තු 31 දිනට ශේෂය (රු.) |
|---|---|---|---|---|
| ඉඩම | 28,000,000 | - | - | 28,000,000 |
| ගොඩනැගිල්ල | 15,000,000 | - | - | 15,000,000 |
| යන්ත්‍ර | 4,000,000 | 5,200,000 | 900,000 | 8,300,000 |
| මෝටර් ලොරි රථය | 3,400,000 | - | - | 3,400,000 |
| **එකතුව** | **50,400,000** | **5,200,000** | **900,000** | **54,700,000** |

- 2017 මැයි මාසයේදී මිලට ගෙන තිබූ යන්ත්‍රයක් 2018 දෙසැම්බර් මාසයේ රු.600,000/- කට විකුණන ලදී.
- ගොඩනැගිල්ල සහ මෝටර් ලොරි රථය, 2016/17 තක්සේරු වර්ෂයේදී මිලට ගෙන / අත්පත් කරගෙන තිබේ.
- 2018 අප්‍රේල් 01 දිනට පැවති අනෙකුත් සියලු වත්කම් සඳහා ප්‍රාග්ධන දීමනාව සම්පූර්ණයෙන් ලබාගෙන ඇත.

(5) 2017/18 තක්සේරු වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ බදු අලාභය රු.6,300,000/- කි.

(6) 2018/19 තක්සේරු වර්ෂය සඳහා ආර්ථික සේවා ගාස්තු ගෙවීම් [Economic Service Charge (ESC)] රු.1,840,750/- ක් විය.

(7) 2018/19 තක්සේරු වර්ෂය සඳහා කාර්තුමය ආදායම් බදු වාරික වශයෙන් සමාගම රු.3,400,000/- ක් ගෙවා තිබේ.

(8) ස්ථාවර තැන්පතු පොලිය මත බැංකුව විසින් අදාල අනුපාතය මත රඳවා ගැනීමේ බදු (WHT) අඩුකරගෙන තිබේ.

(9) ව්‍යාපාරයේ අනෙකුත් සියලු වියදම්, ආදායම් බදු සඳහා ඉඩදෙනු ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2018/19 තක්සේරු වර්ෂය සඳහා පහත සඳහන් දෑ **තක්සේරු කරන්න**:

(a) තක්සේරු කළ හැකි ආදායම,

(b) බදු අයකළ හැකි ආදායම,

(c) ගෙවිය යුතු දළ ආදායම් බද්ද, සහ,

(d) ගෙවිය යුතු ඉතිරි ආදායම් බද්ද.

***සැ.යු:*** *යම් වියදමක් ඉඩ දීමට හෝ ඉඩ නොදීමට හේතු පැහැදිලිව සඳහන් කළ යුතුයි.* (ලකුණු 25)

## 09 වන ප්‍රශ්නය

මෘදුකාංග ඉංජිනේරුවරයෙකු වන **සුරේෂ්,** ශ්‍රී ලාංකීය මෘදුකාංග සමාගමක් වන **සීමාසහිත සීනා පොදු සමාගමෙහි** සේවය කරයි. ඔහු, ඔහුගේ ප්‍රාථමික සේවා නියුක්ති ප්‍රකාශනය **සීමාසහිත සීනා පොදු සමාගම** වෙත ලබාදී තිබේ. එසේම ඔහු **සීමාසහිත සීනා පොදු සමාගමේ** පරිපාලිත සමාගමක අධ්‍යක්ෂකවරයෙකු වශයෙන්ද සේවය කරයි. 2018/19 තක්සේරු වර්ෂය (මින්මතු 'වර්ෂය' යැයි හැඳින්වෙන) සඳහා **සුරේෂ්** සම්බන්ධව පහත සඳහන් තොරතුරු සපයා ඇත:

(1) වර්ෂය තුළදී **සීමාසහිත සීනා පොදු සමාගමෙන්** ඔහුට පහත සඳහන් දෑ ලැබී තිබේ:

- දළ වැටුප - මාසයකට රු.220,000/- ක් බැගින්.
- ඔහුගේ ගමන් බිමන් සඳහා සමාගම ඔහුට ඉන්ධන සමඟ මෝටර් කාරයක් ලබාදී තිබේ. (මෝටර් කාරයේ එන්ජින් ධාරිතාවය 1,750cc කි).
- වර්ෂය තුළදී, ඔහු රෝහල්ගත වූ අතර, මුළු බිල රු.254,000/- ක් විය. සේවා නියුක්තික ගිවිසුම අනුව, සමාගම රු.230,000/- ක් ප්‍රතිපූරණය කර තිබේ. වෛද්‍ය ප්‍රතිපූරණ වියදම් සම්බන්ධයෙන් සියලු සේවකයන් සඳහා සමාන කොන්දේසි ඇතුළත් ප්‍රතිපත්තියක් සමාගමට නොමැත.
- පසුගිය වර්ෂයේ ලබා නොගත් නිවාඩු සඳහා වර්ෂය තුළදී ගෙවූ නිවාඩු පඩි රු.70,000/- කි.
- සේවක අර්ථසාධක අරමුදලට (EPF) සහ සේවක භාරකාර අරමුදලට (ETF) සේවායෝජකගේ දායකත්වය දළ වැටුප මත පිළිවෙලින් 12% ක් සහ 3% කි.

(2) රු.84,000/- ක රඳවාගැනීමේ බද්දක් අඩුකර ගැනීමෙන් පසු රු.636,000/- ක අධ්‍යක්ෂක ගාස්තුවක් වර්ෂය සඳහා පරිපාලිත සමාගමෙන් (ද්විතියික සේවා නියුක්තිය) **සුරේෂ්ට** ලැබුණි.

(3) විදේශීය සමාගමකට සපයන ලද උපදේශන සේවාවන් වෙනුවෙන් ඇමරිකානු ඩොලර් 2,500 ක ගාස්තුවක් **සුරේෂ්ට** ලැබී තිබේ. මෙම ආදායම වාණිජ බැංකුවක ඇති ඔහුගේ නේවාසික විදේශීය මුදල් ගිණුමට බැර කර තිබුණි. (ඇමරිකානු ඩොලර් 1 = ශ්‍රී ලංකා රු.180/-)

(4) ඔහු ලැයිස්තුගත පොදු සමාගම්වල ආයෝජන සිදුකර තිබේ. වර්ෂය තුළදී රු.215,000/- ක ශුද්ධ ලාභාංශ ආදායමක් ලැබුණු අතර, කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කොටස් විකිණීමෙන් රු.153,000/- ක ලාභයක් ලබා තිබේ.

(5) වර්ෂය තුළදී වාසික විදේශ මුදල් ගිණුම මත ඇමරිකානු ඩොලර් 170 ක (රඳවා ගැනීමේ බදු අඩුකළ පසු) පොලී ආදායමක් **සුරේෂ්ට** ලැබී තිබුණි. (ඇමරිකානු ඩොලර් 1 = ශ්‍රී ලංකා රු.180/-)

(6) **සුරේෂ්** වාසය කරන්නේ නුගේගොඩ පිහිටි තට්ටු නිවාසයකයි. ඔහුගේ පාරම්පරික නිවස ගාල්ලේ පිහිටා ඇති අතර, එහි වරිපනම් තක්සේරුව රු.250,000/- කි. වරිපනම් 25% බැගින් ගෙවනු ලැබේ. මෙම නිවස 2018 අප්‍රේල් 01 දින සිට රු.100,000/- මාසික කුලියකට සමාගමකට කුලියට දී තිබේ. වර්ෂයට අදාල කුලිය එක් එක් මාසය අවසානයේදී ගෙවා තිබේ. මාසික කුලී ගෙවීම් සිදුකිරීමේදී සමාගම රඳවා ගැනීමේ බදු [Withholding Tax (WHT)] අඩුකර තිබේ.

(7) වර්ෂය තුළදී ඔහු රු.800,000/- ක් වටිනා පරිගණක උපාධි අපේක්ෂකයන්ගේ ප්‍රයෝජනය සඳහා මොරටුව විශ්ව විද්‍යාලයට පරිත්‍යාග කර ඇත.

(8) **සීමාසහිත සීතා පොදු සමාගම,** වර්ෂය සඳහා අඩුකළ උපයන විට ගෙවීමේ බද්ද (PAYE) රු.164,000/- කි.

ඉහත සඳහන් තොරතුරු ඇසුරෙන්,

**ඔබ විසින් කළ යුතු දෑ:**

2018/19 තක්සේරු වර්ෂය සඳහා **සුරේෂ්ගේ** පහත සඳහන් දෑ **තක්සේරු කරන්න:**

(a) බදු අයකළ හැකි ආදායම,

(b) ගෙවිය යුතු දළ ආදායම් බද්ද,

(c) ගෙවිය යුතු ඉතිරි ආදායම් බද්ද, සහ,

(d) බදු නිදහස් ආදායම (වේ නම්). (ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මතා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |